# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1154 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 14/07/2024 පැය 0550

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.07.13 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ මාකවිට ප්‍රදේශයේ බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 මිලිග්‍රෑම් 10 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මාකවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයේදී මොහු විදේශ රටක සිට මෙරට සංවිධානාත්මක අපරාධ සිදුකරනු ලබන සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇත. බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2024.07.13 වන දින දහවල් කාලයේ තලංගම පොලිස් වසමේ පැලවත්ත ප්‍රදේශයේ තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 31 ක් වන පන්විල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.**

2024.07.13 වන දින උදෑසන කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ කලගෙඩිහේන ප්‍රදේශයේදී වේයන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන දංඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - කරුවලගස්වැව පොලිස් ස්ථානය.**

2024.07.13 වන දින දහවල් කාලයේ කරුවලගස්වැව පොලිස් වසමේ එගොඩපිටිය ප්‍රදේශයේ පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට කරුවලගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වනජීවී නිලධාරීන්ගේ සහාය ඇතිව වැටලීමක් සිදුකර **කැණීම් උපකරණ, පූජා භාණ්ඩ සහ සැකකරුවන් පැමිණි යතුරු පැදි 02 ක් සමඟ සැකකරුවන් 05 දෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40, 46, 55, 57 හා 65 වයස්වල පසුවන නවගත්තේගම, විතිකුලිය හා මස්පොත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කරුවලගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - හොරොව්පොතාන පොලිස් ස්ථානය.**

2024.07.13 වන දින දහවල් කාලයේ හොරොව්පොතාන පොලිස් වසමේ මොරවැව ප්‍රදේශයේදී හොරොව්පොතාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන හොරොව්පොතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරොව්පොතාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පරයනාලන්කුලම් පොලිස් ස්ථානය.**

2024.07.13 වන දින උදෑසන කාලයේ පරයනාලන්කුලම් පොලිස් වසමේ කල්ආරු පාලම අසලදී පරයනාලන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පරයනාලන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. විදේශිකයෙකු දියේ ගිලී මියයාමක් - වැලිගම පොලිස් වසම.**

2024.07.13 වන දින සවස් කාලයේ වැලිගම පොලිස් වසමේ මිරිස්ස මුහුදු තීරයේ විදේශික යුවළක් දිය නෑමට ගොස් සිටියදී කාන්තාව දිය වැලකට හසුව ගසාගෙන ගොස් ඇත. එම අවස්ථාවේදී වෙරල ආරක්ෂක බලකා ජීවිතාරක්ෂක නිලධාරීන් විසින් ඇය ගොඩට ගෙන මාතර රෝහලට ඇතුලත් කර ඇති අතර, ඒ වන විටත් මියගොස් සිට ඇත.

**මරණකාරිය වයස අවුරුදු 37 ක් වන දකුණු කොරියානු ජාතික කාන්තාවකි.**

වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. සැකකටයුතු නාඳුනන මළ සිරුරක් හමුවීම - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.

2024.07.13 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ බණ්ඩාරනායක වටරවුම සහ වදුල්ලවත්ත හන්දිය අතර කොළඹ දෙසට වාහන ඇතුළුවන මංතීරුවේ හිසේ බරපතල තුවාල සහිතව පුද්ගලයෙකු වැටී මියගොස් ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. මෙතෙක් මරණකරුගේ අනන්‍යතාවය තහවුරු වී නොමැත.

**වයස අවුරුදු 35 ක් පමණ පිරිමි පුද්ගලයෙකු වන අතර, උස අඩි 05 අඟල් 06 කි. අවසන් වරට නිල් පැහැති දිග කලිසමක් හැඳ සිටී.**

මෘත ශරීරය සම්බන්ධ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - අත්තනගල්ල පොලිස් වසම.

2024.07.13 වන දින රාත්‍රී කාලයේ අත්තනගල්ල පොලිස් වසමේ නිට්ටඹුව හංවැල්ල මාර්ගයේ ඌරාපොල හන්දියේදී කිරිඳිවැල දෙස සිට ඌරාපොල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් අතුරු මාර්ගයකට හැරවීමට උත්සාහ කිරීමේදී මාර්ගය අයිනේ ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 68 ක් වූ රතඹලේ, ඌරාපොල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අත්තනගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - ලුණුගම්වෙහෙර පොලිස් වසම.

2024.07.13 වන දින සවස් කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ අඩි 100 මාර්ගයේ අඩි 100 ප්‍රදේශයේදී ලුණුගම්වෙහෙර දෙස සිට කුඩා ගම්මාන 06 දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා ගමන්කළ පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා සහ යතුරුපැදිකරු ලුණුගම්වෙහෙර රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී පදිකයා මියගොස් ඇත. යතුරු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා දෙබරවැව රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ ධීවර ගම්මානය, ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පදිංචි මානසික ආබාධයකින් පෙළෙන පුද්ගලයෙකි.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - ගිරිඋල්ල පොලිස් වසම.

2024.07.13 වන දින රාත්‍රි කාලයේ ගිරිඋල්ල පොලිස් වසමේ ගිරිඋල්ල හමන්ගල්ල මාර්ගයේ කොහිලවල ප්‍රදේශයේදී ගිරිඋල්ල දෙස සිට හමන්ගල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක් ඉදිරියෙන් පැමිණි තවත් යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරුවන් දෙදෙනා සහ පසු පැදිකරුවන් දෙදෙනා දඹදෙණිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී යතුරුපැදිකරුවන් දෙදෙනා මියගොස් ඇත. පසු පැදිකරුවන් දෙදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරුවන් අවුරුදු 19 හා 21 වයස්වල පසුවන කුලියාපිටිය හා ගිරිඋල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර දඹදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගිරිඋල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - අම්බලන්ගොඩ පොලිස් වසම.

2024.07.14 වන අද දින අළුයම් කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ අම්බලන්ගොඩ නගරයේදී ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු බලපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වන කුලීගොඩ, අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**